විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය    தலைமுறையொன்றின் பெருமிதம்    Pride of a Generation


මගේ අංකය / எனது இல. / My No. } විවැ/පා01/පොදු(තාව)

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023.07.05

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන්/
ප්‍රධාන කාර්යාලයේ අංශභාර මාණ්ඩලික නිලධාරීන් මගින්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියලුම නිලධාරීන්

**දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය විවිධ විභාග, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ, දේශීය/විදේශීය රැකියා , දේශීය /විදේශීය පුහුණු සඳහා වන අයදුම්පත් ඉදිරිපත් කිරීම සම්බන්ධවයි.**

දෙපාර්තමේන්තුවේ පාලන අංශය වෙත යොමුවන උක්ත අයදුම්පත් පරීක්ෂා කිරීමට හා අදාල ආයතන වෙත යොමුකිරීමට ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය වේ.

02. එබැවින් හැකි සෑම අවස්ථාවකදීම විවිධ විභාග, කාර්යක්ෂමතා කඩඉම් රැකියා හා පුහුණු සඳහා වන අයදුම්පත් පහත කාලරාමුව අනුව පාලන අංශය වෙත යොමු කිරීමට කටයුතු කරන මෙන් දන්වමි.

| අනු අංකය | අයදුම්පත් | පාලන අංශය වෙත ඉදිරිපත් කළ යුතු කාලය (2-6 කරුණු සඳහා රාජකාරි දින ගණන් දක්වා ඇත) |
|---|---|---|
| 1 | දේශීය/විදේශීය රැකියා (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 අනුව) | නිවාඩු අපේක්ෂා කරන දිනට සති 06 කට පෙර (මේ බැව 01/2023 උපදෙස් ලිපියෙන් දැනටමත් දන්වා ඇත.) |
| 2 | විදේශ පුහුණු/සම්මන්ත්‍රණ | අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට දින 07 කට පෙර |
| 3 | දේශීය පුහුණු/ සම්මන්ත්‍රණ | අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට දින 05 කට පෙර |
| 4 | විවිධ ආයතන වල රැකියා අවස්ථා හෝ බඳවාගැනීමේ විභාග සඳහා අයදුම්පත්/ද්විතීයනය සඳහා අයදුම්පත් | අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට දින 05 කට පෙර |
| 5 | කාර්යක්ෂමතා කඩඉම් විභාග අයදුම්පත් | අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට දින 07 කට පෙර |
| 6 | ශ්‍රේණිගත උසස්වීම් සහ වෙනත් විභාග අයදුම්පත් | අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට දින 07 කට පෙර |

03. සෑම අයදුම්පතක් සමඟම, අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ පිටපතක්ද යොමුකල යුතු අතර සියලු ලේඛනයන්හි අමතර පිටපතක් සමඟ එවිය යුතු වේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන නිලධාරීන් බොහෝ අවස්ථාවන්හිදී තැපැල් මගින් ලේඛන යොමුකරන බැවින් ඒ සඳහා ගතවන කාලයද සැලකිල්ලට ගතයුතු බව සඳහන් කරමි.

04. ඉහත සඳහන් විධිවිධාන දෙපාර්තමේන්තුවේ සියළු නිලධාරීන් හට අදාල වන අතර මේ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහය, රාජ්‍ය පරිපාලන හා මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ මගින් ලබාදී ඇති උපදෙස් පිළිබඳව ද අවධානය යොමුකරන ලෙස අවධාරණය කරමි.

05. අයදුම්පත් ප්‍රතික්ෂේපවීම හෝ අදාල ආයතන වෙත ප්‍රමාදවී යොමුවීමෙන් සිදුවන ගැටළු සඳහා දෙපාර්තමේන්තුව වගකීමක් නොදරන අතර මෙම තත්වයන් වලක්වා ගැනීමට ඉහත මාර්ගෝපදේශ තරයේ අනුගමනය කරනු ඇතැයි අපේක්ෂා කරමි.

ඒ.ජගත් ඩී. ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්


මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk